නිපුණතාවය :- 5. මූලික පොත්වල ගනුදෙනු සටහන් කර ලෙජරය ට පිටපත් කරයි .

නිපුණතා මට්ටම :- 5.2. බැංකු ගනුදෙනු බැංකු ගිණුමේ , බැංකු පොතේ වාර්තා කරයි .

(බැංකු ගිණුම තුලනය කිරීම අවාසිදායක ශේෂයක් ඇති අවස්ථාවක දී)

ඔබගේ පෙළ පොතේ පිටු අංක 120 සිට 121 දක්වා හොඳින් කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි සහ නිශ්චිත පිළිතුරු සපයන්න .

01. බැංකු අයිරාව යන්න අර්ථ දක්වන්න .

02. බැංකු අයිරාවක් ඇති වන්නේ කුමක් නිසා ද?

03. බැංකු අයිරාවක් ඇති විටෙක බැංකු ජංගම ගිණුමේ ඇත්තේ කුමන ශේෂයක් ද ?

04. ගිණුම් වර්ගීකරණයට අනුව බැංකු අයිරාව අයත් වන්නේ කුමන ගිණුම් විශේෂයට ද ?

05. දුල්මිණගේ ව්‍යාපාරයේ 2021.03.01. දිනට පැවතියේ රු. 28,000 ක අවාසි දායක බැංකු ශේෂයකි . මාසය තුළ රු.25,000ක මුදල් සහ චෙක් පත් බැංකු ගිණුම තුල තැන්පත් කළ අතර රු. 20,000ක චෙක්පත් ගෙවීම් සඳහා නිකුත් කරන ලදී . 2021.03.31.දිනට බැංකු ගිණුමේ ශේෂය කොපමණ ද? එය හර ශේෂයක් ද ? බැර ශේෂයක් ද ?

පහත සඳහන් ගනුදෙනු බැංකු ගිණුමක සටහන් කර බැංකු ගිණුම තුලනය කර ශේෂයසොයන්න .

2021.08.01. බැංකු ගිණුමේ හර ශේෂය රු.6,000

2021.08.04. මුදල් තැන්පත් කලා. රු. 4,000.

2021.08.14. චෙක් තැන්පත් කලා රු.4,500 .

2021.08.16. චෙක් අංක 632145 ණයහිමියන් ට නිකුත් කලා රු. 8,000 .

2021.08.20. චෙක් තැන්පත් කලා. රු.20,000 .

2021.08.24. චෙක් අංක 632146 අත්පිට ගැණුම් සඳහා නිකුත් කලා. රු. 30,000 .

අභ්‍යාස .

** ඔබගේ පෙළ පොතේ පිටු අංක 121 හි සඳහන් ක්‍රියාකාරකම 02 සඳහා පිළිතුරු සපයන්න .